OL/2009/21-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

21 | S | I,II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

සිංහල භාෂාව හා සාහිත්‍යය I,II சிங்களமொழியும் இலக்கியமும் I,II Sinhala Language and Literature I,II	පැය තුනයි மூன்று மணித்தியாலம் Three hours

සිංහල භාෂාව හා සාහිත්‍යය I

සැලකිය යුතුයි :

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.** මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) උත්තරවලින් **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** හෝ උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

(v) **පිළිතුරු සැපයීමෙන් පසු I හා II පිළිතුරු පත්‍ර එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා භාර දෙන්න.**

● අංක 1 සිට 3 තෙක් ඇති එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අදහසට **වඩාත් සමීප අදහස** තෝරන්න.

1. සංවිධාන අතරේ පවත්නා **කඩඇඳීම** හේතු කොටගෙන තැපැල් කාර්යාලය විවෘත කිරීමේ උත්සවය පසුදිනට කල්දමා ඇත.
(1) අනවබෝධය (2) රණ්ඩුසරුවල් (3) විවාදපන්නය (4) තරගකාරිත්වය

2. **ඉවක් බවක් නැති ව** හැම දෙයකට ම ඇඟිලි ගැසීම නිසා අධිකාරිවරයා සේවකයන් අතරෙහි අප්‍රසාදයට පත්විය.
(1) අනවයරයෙන් (2) අවිචාරශීලීව (3) අනපේක්ෂිතව (4) නිරතුරුවම

3. නගරය **කටුකොහොල් ඉවත්වීම** යදහා සේවක පිරිසක් යෙදවිණි.
(1) එළිපෙහෙළි කිරීම (2) නවීකරණය කිරීම (3) අලංකාර කිරීම (4) ශුද්ධ පවිත්‍ර කිරීම

● අංක 4 සිට 7 තෙක් ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැන සඳහා **වඩාත් සුදුසු පදය** තෝරන්න.

4. දීපව්‍යාප්ත කෘෂි ව්‍යාපෘති මහින් රජය අපේක්ෂා කරන්නේ ..... කාර්යය කඩිනම් කිරීම ය.
(1) සංස්කරණ (2) ප්‍රවාරණ (3) සංවර්ධන (4) සංශ්ලේෂණ

5. තම සහායකයාගේ ජයග්‍රහණය ගැන ..... සහායකයෝ ඔල්වරසන් දුන්හ.
(1) ඔකඳවුණු (2) කම්පිතවුණු (3) විපරිතවුණු (4) විපිළිසරවුණු

6. මනස වූ කලි ශරීරය නමැති ද්‍රව්‍ය සංවිධානයේ ප්‍රතිඵලයකැයි ..... කළ අපරදිග විද්‍යාඥයෝ ද්‍රව්‍යයට ප්‍රධාන තැනක් දුන්හ.
(1) නිර්මාණය (2) නිර්ණය (3) නිර්යාත (4) නිර්බාධ

7. නිෂ්පාදන ඉලක්කය සපුරා ගැනීම සඳහා උද්යෝගයෙන් ක්‍රියාකළ සියලු ම සේවකයන්ට ..... ලැබුණේ ය.
(1) පාරිතෝෂිකයක් (2) පරිහාරයක් (3) පරිශ්‍රමයක් (4) පරිමාණයක්

8. හැම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ලෙස යෙදී ඇති පද පෙළිය තෝරන්න.
(1) දුෂ්කර, සම්ප්‍රධාන, විරෝධාර, කොට්ඨාසය (2) මද්‍යසාරය, විමර්ශණය, මර්ධනය, ප්‍රතිඵලය
(3) ශ්‍රව්‍යකාව්‍යය, වෛද්‍යය, ඖෂධය, විශේෂණය (4) ප්‍රස්තාරය, ශිෂ්ටාචාරය, දෘෂ්ටිය, අලුයම

9. මුලින් දී ඇති පදයට අර්ථයෙන් **බොහෝ දුරට සමාන** අර්ථය දෙන වරණය තෝරන්න.
(1) ග්‍රන්ථය - ග්‍රන්ථිය (2) ආරම්භය - ප්‍රාරම්භය
(3) පහුර - පවුර (4) සංත්‍රාසය - සංවේගය

[දෙවැනි පිටුව බලන්න.

Download Past Papers & Answers at : www.freebooks.lk

10. මූලින් දී ඇති පදයේ **විරුද්ධාර්ථය** ඇති වරණය තෝරන්න.
(1) ආස්වාදය - ආනිශංසය (2) ශිථිල - දෘඪ
(3) සංවර්ධනය - නිෂේධනය (4) උත්තේජනය - උත්ථානය

11. මූලින් දක්වෙන ව්‍යාකරණ විධියට අයත් **නොවන** උදාහරණයක් දී ඇති වරණය තෝරන්න.
(1) තද්ධිත - රසවත්, නාගරික, කළුවි, සුපිරිසිදු
(2) ක්‍රියා - බමයි, බලන, නිදයි, වපුළ
(3) නාම - ඡායාව, සියපත්, කදුර, නරයි
(4) නිපාත - නමුත්, සඳහා, පිණිස, ඉක්බිති

• අංක **12** සිට **16** තෙක් ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු කොටස තෝරන්න.

12. පොහෝ දිනවල වෛත්‍ය රාජයා ප්‍රදීපාලෝකයෙන් .....
(1) බැබළෙත්. (2) බැබළුණු. (3) බබළයි. (4) බැබළුණහ.

13. එදා හවස අප යන විට ඔරු ද පාරු ද රාශියක් වෙරළේ තැනින් තැන .....
(1) තිබුණේ ය. (2) තිබුණේ ය. (3) තිබුණා ය. (4) තිබුණා හ.

14. විපතේ දී අසරණයන්ට ..... නම් පිහිටවෙත් ද?
(1) කවරෙක් (2) කවරකු (3) කවුරු (4) කවුරුන්

15. ආබාධිත ළමයකු ගැන ..... විසින් රචිත ප්‍රබන්ධයකට මෙවර ප්‍රථම තෑගය හිමිවිය.
(1) ගුරුවරියක් (2) ගුරුවරියෙක් (3) ගුරුවරියකු (4) ගුරුවරියක

16. ..... පැමිණ සිටින බව මුලසුනෙන් පැවසිණි.
(1) නියෝජිතයෝ සියල්ලෝ ම (2) නියෝජිතයන් සියල්ලෝ ම
(3) නියෝජිතයන් සියල්ලන් ම (4) නියෝජිතයෝ සියල්ලන් ම

• අංක **17** සිට **21** තෙක් ඇති ඇති වාක්‍යවල දක්නට ලැබෙන වරද කුමක්ද යන්න ඉදිරිපත් කොට ඇති ප්‍රකාශ අතුරෙන් තෝරන්න.

17. ඉක්මනින් විසඳිය යුත්තේ කථාකරන භාෂාවෙන් පොත් ලිවිය යුතු ය.
(1) ලිවිය යුතු ද යන්න ය නොයොද ලිවිය යුතු යැයි යෙදීම
(2) ලියනු යුතුයැයි නොයොද ලිවිය යුතු යැයි යෙදීම
(3) ලේඛන රීතියෙන් යැයි නොයොද කතාකරන භාෂාවෙන් යැයි යෙදීම
(4) අනුක්‍රමයෙන් යැයි නොයොද ඉක්මනින් යැයි යෙදීම

18. සුදත්තගේ උපදෙස් සාමාජිකයන් නොමහ යන සුලු ය.
(1) සාමාජිකයෝ යැයි වියයුතු තැන සාමාජිකයන් යැයි යෙදීම
(2) සුදත්ත දුන් උපදෙස් යන්න වෙනුවට සුදත්තගේ උපදෙස් යැයි යෙදීම
(3) නොමහට යන්න නොයොද නොමහ යැයි යෙදීම
(4) යවන සුලු යන්න වෙනුවට යන සුලු යැයි යෙදීම

19. යෝජනාවෙන් කියවෙන්නේ රට රැකීමට එකා මෙන් නැඟී සිටිය යුතු ය.
(1) සිටිය යුතු ම යැයි අවධාරණය නොකොට තිබීම
(2) යෝජනාවෙන් ඉදිරිපත්වන්නේ යැයි නොකියා කියවෙන්නේ යැයි යෙදීම
(3) සිටිනු යුතුය යැයි යෙදීම වෙනුවට සිටිය යුතු යැයි යෙදීම
(4) නැඟී සිටිය යුතු බවය යන යෙදුම වෙනුවට නැඟී සිටිය යුතු ය යැයි යෙදීම

20. මාමා දැන් රක්ෂාව කරන්නේ රථවාහන මිලයට ගැනීම හා විකුණන ස්ථානයක ය.
(1) විකිණීම කරන යැයි නොයොද විකුණන යැයි යෙදීම
(2) මිලයට ගෙන යන්න වෙනුවට මිලයට ගැනීම යැයි යෙදීම
(3) දනට රක්ෂාව කරනුයේ යැයි නොයොද දැන් රක්ෂාව කරන්නේ යැයි යෙදීම
(4) වෙළඳම් කරන යන්න වෙනුවට විකුණන යැයි යෙදීම

21. මට කියන්නට ඇත්තේ සියලු දෙනා ම එකා මෙන් සමගියෙන් නැඟී සිටීමට අධිෂ්ඨාන කරගෙන සිටීම යි.
(1) කියන්නට ඇත්තේ යැයි අනවශ්‍ය කොටයක් යෙදීම
(2) නැඟී සිටීම වෙනුවට සිටීමයි යන්න යෙදීම
(3) සිටින බවය යැයි නොයොද සිටීමයි යන්න යෙදීම
(4) එකා මෙන් යැයි කියා සමගියෙන් යැයි නැවතත් කීම

[තුන්වැනි පිටුව බලන්න.

Download Past Papers & Answers at : www.freebooks.lk

• අංක 22 සිට 24 තෙක් ඇති ප්‍රකාශවල තද කළු අකුරෙන් යුත් කොටස්වල **අර්ථය ඇති** කොටස තෝරන්න.

22. **වදිනුව** පා පියුම් පෙති - එකුමරු නැවී ගති
(1) වදිනු මැනවි (2) වදින විට (3) වදින්නට පෙර (4) වදිනු පිණිස

23. විද්‍යාඥයා එළවලු **විජලන ක්‍රමයක්** යොදා ගත්තේ ය.
(1) ජල මුක්ත කිරීමේ විදියක් (2) ජලයෙහි ගිල්වා තබන ආකාරයක්
(3) විශේෂ ජල පහසු සැලැස්මක් (4) ජලය හා එළවලු මිශ්‍රණ ජාලයක්

24. පන්දුව යැවීමේ විද්‍යාත්මක ක්‍රමය හෙතෙම **ආදර්ශනය කරයි.**
(1) හුරුකර ගනී. (2) මැනවින් කර පෙන්වයි.
(3) නිරීක්ෂණය කරයි. (4) නිර්දේශ කරයි.

• 'අ' වශයෙන් ඇති වාක්‍යවල අදහස 'ආ' වශයෙන් දක්වීමට හිස්තැනට වඩාත් සුදුසු කොටස තෝරන්න.

25. (අ) මවුබිමට බරක් නොවී ජීවත්වීමට තරුණයෝ ඉටා ගත්හ.
(ආ) මවුබිමට බරක් නොවී ..... තරුණයෝ ඉටා ගත්හ.
(1) ජීවත්වන්නට යැයි (2) ජීවත්විණැයි (3) ජීවත් වෙනියි (4) ජීවත් වෙමුයි

26. (අ) ලබන සෙනසුරාදා පවත්වනු ලබන්නේ නිදහස සමරන උත්සවයයි.
(ආ) ලබන සෙනසුරාදා පවත්වනු ලබන උත්සවයේ දී නිදහස .....
(1) සමරයි. (2) සමරති. (3) සැමරිය. (4) සැමරේ.

27. (අ) මුහුදු පතුළට බැස්සා වූ කිමිදුම්කරුවෝ නැවේ යුන්බුන් සොයන්නට වූහ.
(ආ) ගිලුණු නැවේ යුන්බුන් සොයන්නට කිමිදුම්කරුවෝ මුහුදු පතුළට .....
(1) බටහ. (2) බැසිය. (3) බැසූහ. (4) බස්නාහ.

28. (අ) ඒ කපිකයාගේ වාග් විලාසය වේගවත් ය. එහෙත් පැහැදිලි ය.
(ආ) ඒ කපිකයාගේ වාග් විලාසය .....
(1) වේගවත් වූයේ පැහැදිලියි. (2) වේගවත් ද පැහැදිලි ද වේ.
(3) වේගවත් වුවත් පැහැදිලි ය. (4) වේගවත් වෙමින් පැහැදිලි ය.

29. පහත දක්වෙන ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශය** තෝරන්න.
(1) අවසාන ක්‍රියාව කරද්දී කර්තෘ විසින් කරනු ලබන ක්‍රියා මිශ්‍ර ක්‍රියා නම් වේ.
(2) නිළිය ගී ගයගයා නටයි. මෙහි ගයගයා යනු පූර්ව ක්‍රියා අර්ථය දේ.
(3) ක්‍රීඩකයා උඩපන්දුව අල්ලයි. අල්ලයි යන ක්‍රියාපදයේ කර්මකාරක, අතීතකාල ඒක වචන ක්‍රියාපදය ඇල්ලීමි යන්න ය.
(4) 'තම' ශබ්දයෙහි ප්‍රථමා විභක්ති, ස්ත්‍රී ලිංග, බහු වචන පදය නොමෝ ය.

30. **අකාරාදී පිළිවෙළට** නම් යෙදී ඇති පේළිය තෝරන්න.
(1) කුමාරදස, චන්ද්‍රසේන, සෝමපාල, හරිශ්චන්ද්‍ර
(2) ආරියසිංහ, කරුණාදස, සෝමාවති, චන්ද්‍රපාල
(3) ගුණසෝම, පද්මසේන, ලක්ෂ්මි, මොහමඩ්
(4) පියසීලි, ඩේවිඩ්, ජිනසේන, රත්නසිංහම්

• අංක 31 සිට 34 තෙක් ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට **වඩාත් සමීප අදහස දෙන** වරණය තෝරන්න.

31. මෙන් කමලේ දෙන රැවී මිහිලොල්
(1) මී මැස්සන් නද දෙමින් මල්හි සැරියරන්නාක් මෙන්
(2) මධු පානයට පොදි ගැසුණු මී මැයි රංචු මෙන්
(3) නෙලුම් මල්හි නද දෙන මී මැස්සන් මෙන්
(4) මල් සුවඳෙහි වශීකෘත මධුපානින් මෙන්

32. ආහාර ද්‍රව්‍යවල අඩංගු පෝෂ්‍ය පදාර්ථ වර්ධනය කිරීමේ කාර්යය බොහෝ රාජ්‍යයන්හි සංවර්ධන සැලසුම්වල ප්‍රමුඛතාව ලබාගෙන ඇත.
(1) ආහාර ද්‍රව්‍යවල පෝෂණ ගුණය වර්ධනය කිරීම උදෙසා බොහෝ රටවල් තම සැලසුම්වල මුල් තැන දී ඇත.
(2) බොහෝ රටවල සංවර්ධන කාර්යයේ ප්‍රමුඛතාව ලබාගෙන ඇත්තේ ආහාර ද්‍රව්‍යවල පෝෂණ ගුණය දියුණු කිරීමට ය.
(3) සංවර්ධන සැලසුම් යනුවෙන් බොහෝ රටවල් අදහස් කරන්නේ ආහාර ද්‍රව්‍යවල පෝෂ්‍ය පදාර්ථ වර්ධනය කිරීමයි.
(4) බොහෝ රටවල් ආහාර ද්‍රව්‍යවල පෝෂණ ගුණය වර්ධනයට සැලසුම් යකසා ඇත.

[ඔතරමෙහි පිටුව බලන්න.

Download Past Papers & Answers at : www.freebooks.lk

33. අනාගත සංවර්ධනයට ඉඩ පහසුකම් සැලසෙන පරිදි නගර ප්‍රතිසංස්කරණයන් ප්‍රශ්න පැන නොනහින ලෙස මනාව සැලසුම් කළ අලුත් නගර බිහි කිරීමක් රටකට අවශ්‍ය ය.
(1) නගර ප්‍රතිසංස්කරණය මෙන් ම නව නගර නිර්මාණය ද සංවර්ධනය වන රටකට අවශ්‍ය ය.
(2) යහපත් සැලසුම් අනුව කරන නගර නිර්මාණය මෙන් ම නගර පිළිසකර කිරීම, දියුණුවන රටකට අවශ්‍ය ය.
(3) නගර කවිකරණය හා නව නගර පිහිටුවීම යදහා රටකට හොඳ සැලසුම් අවශ්‍ය ය.
(4) සංවර්ධනයට ඉඩදෙමින් කරන නගර පිළිසකර කිරීමත්, සැලසුම් සහගත නව නගර නිර්මාණයත් රටකට අවශ්‍ය ය.

34. මදුරුවන්ට පැරදුණුවුන් විසින් වන සතුන්ට උරුමකර දුන් බිම් පෙදෙස්වලින් දැන් දැන් මිනිස් කටහඬ ඇසෙයි.
(1) මැලේරියාවට බියෙන් ජනයා තම නිවාස හැර දමා යති.
(2) වන සතුන් හා සෙසු සතුරන් අභිබවමින් මිනිස්සු ගොවිතැන් කරති.
(3) වන ප්‍රදේශ යළි ජනාවාස බවට පරිවර්තනය වෙමින් පවති.
(4) සතුන් මැඩලන ගොවිහු ශීඝ්‍රයෙන් ඉදිරියට යති.

● අංක 35 සිට 37 තෙක් ප්‍රශ්නවල ඇති 1,2,3,4 යන වාක්‍ය අතුරෙන් **වාග්කරණානුකූලව නිවැරදි** වාක්‍යය තෝරන්න.

35. (1) රියදුරන් නොසැලකිලිමත් වීම නිසා මහින් අනතුරුවලට ගොදුරු වෙතියි වාර්තාවල දැක්වේ.
(2) රියදුරෝ නොසැලකිලිමත් වීම නිසා මහිහු අනතුරුවලට භාජනය වෙතියි වාර්තාවල දැක්වෙති.
(3) රියදුරන් නොසැලකිලිමත් වීම නිසා මහිහු අනතුරුවලට භාජන වන්නේ යැයි වාර්තාවල දැක්වේ.
(4) රියදුරෝ නොසැලකිලිමත් වීම නිසා මහිහු අනතුරුවලට භාජනය වන්නේ යැයි වාර්තාවල දැක්වේ.

36. (1) වෛද්‍ය විශේෂඥයන් විසින් සත්තු යොදා ගෙන කළ පර්යේෂණ හේතුකොටගෙන වසූරිය දුරු කිරීමට හැකිවීම ගැන කවුරුත් සතුටු වේ.
(2) වෛද්‍ය විශේෂඥයන් විසින් සතුන් යොදාගෙන කරන ලද පර්යේෂණ කරණකොට ගෙන වසූරිය තුරන් කිරීමට හැකිවීම ගැන කවුරුත් සතුටු වෙති.
(3) වෛද්‍ය විශේෂඥයෝ සත්තු යොදාගෙන කරනු ලැබූ පර්යේෂණවල පල වශයෙන් වසූරිය මරා දැමීමට හැකිවීම ගැන කවුරුත් සතුටු විය.
(4) වෛද්‍ය විශේෂඥයින් විසින් සත්තු යොදාගෙන කළ පර්යේෂණ නිසා වසූරිය කුරන් කිරීමට හැකිවීම ගැන කවුරුත් සතුටු වෙති.

37. (1) විභාගයෙන් සමත්වූවෝ අතුරෙන් වැඩිදෙනෙක් පාසල් අයදුම්කරුවන් ය.
(2) විභාගයෙන් සමත්වූවෝ අතුරෙන් වැඩිදෙනකු පාසල් අයදුම්කරුවන් ය.
(3) විභාගයෙන් සමත්වූවන් අතුරෙන් වැඩිදෙනකු පාසල් අයදුම්කරුවන් ය.
(4) විභාගයෙන් සමත්වූවන් අතුරෙන් වැඩිදෙනෙක් පාසල් අයදුම්කරුවෝ ය.

38. **වචන දෙකක අර්ථය වැරදි ලෙස** දක්වා ඇති වරණය තෝරන්න.
(1) පහන් සිහින් - පැහැදුණු සිහින්, අවිකූටකේ - තද අවිවේ, විහඟුන් - තුරහුන්, ප්‍රඥ පාටවය - බුද්ධි ප්‍රභාව
(2) ආහ්ලාද ජනක - සතුට උපදවන, ජල හරණය - ජලය පිටකිරීම, සෝපානය - සේතුව, දිනිඳු - සූර්යයා
(3) විශ්ලේෂණය - විග්‍රහය, පරිපාකයට - පිරිහීමට, හෝඩුවාව - ආරංචිය, ප්‍රත්‍යවේක්ෂණය - යළි නුවණින් සලකා බැලීම
(4) පරෑපවාද - අනුන්ගේ අවවාද, පුල්තඹර - නිල්මානෙල්, තුනුවඟ - ස්ත්‍රීන්, හදනා නොසිනා - හිත සතුටින් පිරි යන

39. තඹ වතුරෙවී තුරු බිජු රැඳි තුබ කෙතට
දිලිළවගෙවී ගනදුරු හුණ වන පෙතට
දිනපති දෙවි රද එන මහ නියම කොට
බැඳි දද එවි අරුණලු නැඟි පෙරඹ රට

මේ කවියෙන්, කළු කපා එළිය ගැන කියැවේ. ඒ සම්බන්ධයෙන් පහත දක්වෙන **වැරදි** කියමන තෝරන්න.
(1) තුබ කෙතට වතුරකි.
(2) හුණුවනයට ළවගකි.
(3) අඳුරට මං පෑදීමකි.
(4) හිරු එන මහ දක්වෙන දද පෙළකි.

40. කටුරොද මඩ වගුරුවල මානෙල් ඕලු
මැණිකෙගෙ මුහුණ බැලුමට පොර කනවා ලූ

මෙයින් දක්වෙන්නේ
(1) කටුරොද ජලාශවල මල්පිපී තිබූ බවයි.
(2) ඕලු මානෙල් අතර පිපීම පිළිබඳ තරගයක් ඇති බවයි.
(3) මැණිකේගේ මුහුණ චිත්තාකර්ෂණීය බවයි.
(4) කටුරොද මඩ වගුරු පවා ඇය ගැන සතුටු වන බවයි.

**

Download Past Papers & Answers at : www.freebooks.lk

සිංහල භාෂාව හා සාහිත්‍යය II

❊ ප්‍රශ්න **සියල්ලට** ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

1. අංක (i) සිට (x) තෙක් ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

(i) පහත දක්වෙන අකුරු ඇතුළත් කොට අර්ථවත් වචනය බැගින් ලියන්න.
(අ) ඣ (ආ) ඟ

(ii) පහත යදහන් පද විසන්ධි කොට ලියන්න.
(අ) පලාපල (ආ) අත්‍යුත්තම

(iii) පහත යදහන් සමාසවලට උදහරණය බැගින් දක්වන්න.
(අ) විශේෂණ සමාසය (ආ) දකාරාර්ථ සමාසය

(iv) (අ) පහත යදහන් වාක්‍යයේ යෙදී ඇති නාම පද ස්ත්‍රී ලිංග නාම පද බවට හරවා සම්පූර්ණ වාක්‍යය ම ලියන්න.
වදුරා ද මුවා ද කොටුලා ද සමහි ව විසූහ.

(ආ) පහත යදහන් වාක්‍යයේ යෙදී ඇති නාම පද බහු වචන නාම පද බවට හරවා සම්පූර්ණ වාක්‍යය ම ලියන්න.
ලී කොටය ගංගාවට පෙරළන ළමයා දෙස බලන්න.

(v) පහත යදහන් වාක්‍යවල පද ගැළපීම අවුල් සහගත ය. ඒවා නියි ලෙස ගළපා සම්පූර්ණ වාක්‍ය ම ලියන්න.
(අ) නිර්මාංසාහාර හිතකර බව ශරීරයට ආයුර්වේද අපේ පුරාණ පොත පතෙහි දක්වේ.
(ආ) විශාල ජනකායක් වයන ඉන්දියාව ගොවිතැනින් යැපෙන අපේ ආසියාවේ පිහිටි අසල්වැසි රටකි.

● පහත යදහන් කවි පෙළ කියවා අංක (vi) සිට (x) තෙක් ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

නදින් බමර ගී යරින් පිරුණු විල්
තෙරේ පවන වැලපේ
නිලින් බැබළි තුරු ලතා පිපුණු හිම
පෙතේ ඉපල් ලෙසිනේ

පැලේ කවිය නැත රැයේ තනිය ඇත
කුසේ ගින්න ඇවිලේ
ළිපේ අඟුරු මත තබා පිසින්නට
දෙයක් නොමැත ගෙපැලේ

ගිරා කොබෙයි රැළ රිළා වදුරු පෙළ
පලා ගියා වැන්නේ
ඇදී වලා වැසි නිවා තැවුල් ගිනි
නහන් සිනා දෙරණේ

(vi) මුල දී විල්වල පැවති තත්ත්වය කුමක් ද?
(vii) දන් වනයේ සිදු වී ඇති වෙනස කවරේ ද?
(viii) "පැලේ කවිය නැත" යන්නෙන් කවියා අදහස් කරන්නේ කුමක් ද?
(ix) මේ කවියාගේ ප්‍රාර්ථනය කුමක්දැයි තනි වාක්‍යයකින් ලියන්න.
(x) සරින්, ඉපල් යන පදවල තේරුම ලියන්න. *(ලකුණු 20)*

[අයවැයි පිටුව බලන්න.

Download Past Papers & Answers at : www.freebooks.lk

2. පහත දක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන, **වචන 250 ක පමණ** රචනයක් ලියන්න. එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති අකුර ප්‍රශ්න අංකය යමහ ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

- ❊ අන්තර්ගත විය යුතු කරුණු
- ❊ ඡේද සංඛ්‍යාව
- ❊ කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- ❊ යොදා ගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ මහ පෙන්වීමක් අදළ විස්තරය ඇසුරෙන් ලබාගන්න.

(අ) අපේ රටේ ජනගහනයෙන් වැඩි කොටසක් ජීවත් වන්නේ ගම්බද ප්‍රදේශවල ය. ඔවුන්ගෙන් වැඩි දෙනකු ගොවිතැනින් ජීවත් වන අතර රටේ ඉඩම්වලින් විශාල කොටසක් යට වී ඇත්තේ ද ගොවිතැනට ය. රටේ ස්වාධිනත්වය රැක ගැනීම සඳහා දරන ප්‍රයත්නයේ දී ආහාර අතින් ස්වයංපෝෂණය වීම මූල් තැන ගනී. මේ කාර්යයෙහි ලා ක්‍රියාත්මක වන ව්‍යාපාර බොහෝ ය. පායල් ළමයින් වශයෙන් අප ද එයට දායක විය යුතු ය.

(ආ) ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා ගැන ලෝක වාසීන් දක්වන උනන්දුව ඉහළ යමින් පවතී. මෑත කාලයේ දී අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික මෙන් ම ජාත්‍යන්තර ප්‍රසාදය දිනාගත් අවස්ථා බොහෝ ය. ශාරීරික සෞඛ්‍යය හා සමාජ සාරධර්ම වර්ධනය, බුද්ධි වර්ධනය හා ජගත් කීර්තියට පත්වීම ක්‍රීඩාවල නිරත වීමෙන් ලබන ප්‍රයෝජන අතර වෙයි. ක්‍රීඩා කටයුතු සංවර්ධනය සඳහා රජයේ මෙන් ම විවිධ සංවිධානවල අනුග්‍රහය ලැබීම යතුටට කාරණයකි.

(ඉ) ලෝක ජනගහනය ශීඝ්‍රයෙන් වර්ධනය වන අතර මනුෂ්‍ය පරමායුෂ ද ඉහළ නහිමින් පවතී. එහෙත් ස්වාභාවික ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය අවශ්‍ය වේගයෙන් ඉහළ යන බවක් නො පෙනේ. මේ නිසා අනාගතයේ දී කෘත්‍රිම ආහාර මගින් ජීවත්වීමට අපට සිදුවනු ඇත. මෙහි දී පෝෂ්‍ය පදාර්ථ හඳුන්වාදීම විද්‍යාවේ හා තාක්ෂණයේ ප්‍රධාන වගකීම වන්නේ ය. එවන් අවධියක මිනිස් ජීවිත හා බැඳෙන වෙනස්කම් බොහෝ විය හැකිය.

(ඊ) ලොව ජය ගැනීමට මිනිස් යන්ත්‍රානයේ පවතින්නේ නොනිත් ආශාවකි. මේ හේතුවෙන් පෞද්ගලික මෙන්ම පොදු ආකල්පද අන් අය අභිබවා යාමේ අවශ්‍යතා මත පෙළගැසෙමින් පවතී. මෙම නොනිමි ගමනෙහි අවසානයක් දකිය නොහැකි ය. සියලු නවීන තාක්ෂණික සොයා ගැනීම් දිනෙන් දිනම නිරන්තරයෙන් නවීකරණය වන අයුරු විද්‍යාමාන වුව ද මිනිස් සිත්ඝතත් තුළ වර්ධනය විය යුතු සාරධර්ම කෙමෙන් කෙමෙන් පරිහානියට යන අයුරු දක්නට ලැබේ. සාරධර්මවලින් තොරවන මිනිසා සිත් පිත් නැති තාක්ෂණික මෙවලම් මත යැපීමට යාමෙන් සිදුවනුයේ බරපතල ව්‍යසනයකි. *(ලකුණු 25 යි)*

3. පහත දක්වෙන පාඨය වචන **50 - 55** අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න.

වර්තමාන ලෝකයේ හැම රටක ම පාහේ අවධානය සංවර්ධනය කෙරේ යොමු වී පවතී. පරිණාමය නමින් අප හඳුන්වන්නේ මේ සංවර්ධනය යි. එය යුගයෙන් යුගයට විවිධ ස්වරූප ගනිමින් නව ගොඩනැගිලි කර්මාන්තශාලා ආදිය බිහි කරයි. ගහකොළ කැපී කෙවී යාම, සත්ත්ව ජීවිතයට ඇති ඉඩකඩ සීමා වීම එහි ලා ඇතිවන දෘශ්‍යමාන ප්‍රතිඵලයි. දිර්ඝ කාලීන සැලැස්මකින් තොර ව සංවර්ධනයේ නාමයෙන් කෙරෙන පරිසර විනාශය සත්ත්ව වර්ගයාගේ විනාශයට දොර හැරීමකි. තාක්ෂණික දියුණුව උපයෝගී කර ගනිමින් මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමට මං පෙත් විවෘත කරගෙන ඇතත් ඒ බලවේග නිසා පරිසරයට වන හානිය වළක්වා ගැනීමට සිදු වී තිබීම අප ඉදිරියේ ඇති බලවත් අභියෝගයකි. ශාක පද්ධතිය නැතිවීට වාතය අපිරිසිදු වීමට ද, ජල මට්ටම අඩු වීමට ද, ඉඩ ඇත. මේ කරණ කොටගෙන කෘෂිකර්මය හා සත්ත්ව පාලනය මිහිපිටින් අහෝසි වීමට ද ඉඩ තිබේ. මෙසේ බලන විට සංවර්ධන කාර්යයේ දී අපේ දැඩි අවධානය යොමු විය යුත්තේ තාක්ෂණික බලවේගවලින් පරිසරය සුරැකීම කෙරෙහි බව පැහැදිලි ය. ඵලදායිතාව වැඩිකර ගැනීමේ අදහසින් දන් දන් බහුල ලෙස කෙරෙන කෘත්‍රිම පොහොර භාවිතය නිසා ජලය දූෂණය වී සත්ත්ව ජීවිතය හා ශාක ජීවිතය විනාශවීමට ඉඩ ඇති බව මුළු ලෝකයා ම පිළිගත යුතු කාරණයකි.

(ලකුණු 10 යි)

[තවත් පිටුව බලන්න.

Download Past Papers & Answers at : www.freebooks.lk

4. පහත දක්වෙන කොටය කියවා ඒ සමඟ ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.

සමාජයේ පැවැත්ම සඳහා කරනු ලබන මිනිස් කටයුතු බොහෝ ය. තනිව කළ නොහැකි වැඩ බොහෝ වූ නිසා මිනිසා ආදියෙහි සිට ම සහයෝගයෙන් කටයුතු කිරීමට පුරුදු විය. එකෙකුට හෝ දෙදෙනකුට විශාල බරක් වැඩි දුරක් උසුලා ගෙනයාමට නුපුළුවන. එහෙත් කිහිපදෙනකු එකිනෙකාට අත්දැව්වෙමින් ක්‍රියා කළහොත් එය ලෙහෙසියෙන් ම කළ හැකි ය. සරලක්‍රම අනුගමනය කරමින් ගොවිතැන් කළ ආදි යුගයේ දී පවා මිනිසාට අන්‍යොන්‍ය සහායත්වය අවශ්‍ය විය. කෘෂිකර්මයේ ව්‍යාප්තියත් සමඟ ම ඊට සම්බන්ධ කාර්යයන් රාශියක් පැන නැංගේය. ඒ ඒ කාර්යය සඳහා අවශ්‍ය විශේෂ දක්ෂතා ද ඒ දක්ෂතා ප්‍රගුණ කොටගත් පිරිස් ද අවශ්‍ය වූ බව පෙනේ. මෙහි දී ඇතැම් පිරිසක් යම් යම් වැඩක නිපුණතාවකුත් තවත් පිරිසක් වෙන විදියක කාර්යයක නිපුණතාවකුත් ලබන්නට යොමු වූහ. දක්ෂතා අතර වෙනස්කම් ඇති විවිධ වෘත්තීන් බිහිවූයේ මේ අන්දමට ය. මේ ආකාරය කොතරම් දුරට පුළුල් වී තිබේ ද යත් අද කම්සයක බොත්තමක් ඇල්ලීම වැනි කටයුත්තක් පවා එහි ලා විශේෂ පුහුණුවක් ලත් අයකුගේ කාර්යයක් බවට පත් වී ඇත. ශ්‍රම විභජනය හෙවත් රැකිරක්ෂා බෙදී යෑමට මහ පෑදෙන්නට ඇත්තේ මේ අන්දමට ය.

(i) මේ පාඨයෙන් ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන ප්‍රධාන අදහස කුමක් ද?

(ii) ආදි මිනිසා සාමූහික ව කටයුතු කරන්නට පෙලඹුණේ ඇයි?

(iii) "ලොවින් එකෙක් එක දෙයකට වෙයි සමත" යන පැරණි කියමනේ සාමාන්‍ය අදහස දක්වෙන කොටස මේ පාඨයෙන් ලබාගෙන තනි වාක්‍යයකින් ලියන්න.

(iv) "කම්සයක බොත්තමක් ඇල්ලීම" යන නිදර්ශනය දක්වා ඇත්තේ කවර අදහසක් කියා පෑමට ද?

(v) අර්ථ දක්වන්න.

(i) විභජනය (ii) නිපුණතාව *(ලකුණු 10 යි)*

5. රුක්මල් වැව පොලිස් ස්ථානාධිපති විසින් ඇඹිලිපිටියේ විපුල ප්‍රජා මණ්ඩලයේ ලේකම් ජයන්ත සූරියකාන්ත වෙත එවන ලද ලිපියකින් කොටයක් පහත දක්වේ. එම ලේකම් ඔබ යැයි සිතා මෙයට වචන **100** කින් පමණ පිළිතුරක් ලියන්න.

වෙළෙඳ ව්‍යාපාරිකයන් කිහිපදෙනකුගේ ද මුදල් ආධාර ඇතිව මෙවර පැවැත්වෙන බක්මහ උළෙලට ඔබ ප්‍රජා මණ්ඩලයේ සහයෝගය අපේක්ෂා කරමි. ජන ගායනා හා ජන නැටුම්, ජාතික ක්‍රීඩා ආදිය පිළිබඳ තරග එහි දී පැවැත් වේ. ගැහැනු පිරිමි දෙපක්ෂයට ම සහභාගි විය හැකි ය. ඉහත කී අංශ සඳහා ඔබ ප්‍රජා මණ්ඩලයේ සහභාගිත්වය ද අපේක්ෂා කරනු ලබනඅතර සහභාගි වන තරග ඉසවු පිළිබඳ විස්තර අපට අවශ්‍ය ය. ළමා තරුණ වැඩිහිටි සියල්ලන්ට ම වෙන් වෙන් ව ඉදිරිපත් විය හැකි තරග රාශියක් ඇත.

නැතහොත්

පහත යදහන් වන්නේ පුවත්පත් වාර්තාකරුවකුගේ දළ සටහනක උපුටනයකි. එය උපයෝගි කරගෙන පුවත්පතකට සුදුසු වාර්තාවක් සපයන්න. (වචන 100 ක් පමණ යැයි.)

සිංහල සාහිත්‍ය තරගාවලියේ සම්මාන ප්‍රදානය

දිනය - 2009.12.10

වේලාව - ප.ව. 10.00 සිට ප.ව. 2.00 දක්වා

සහභාගිත්වය - ජයග්‍රාහකයින්, ආරාධිත අමුත්තන්, පළාත් නියෝජිතයින්

ප්‍රධානත්වය - ගරු අධ්‍යාපන ඇමතිතුමා

මෙහෙයවීම - අගනුවර ශාස්ත්‍රෝදය සංගමය

ස්ථානය - මහජන පුස්තකාල ශ්‍රවණාගාරය *(ලකුණු 15 යි)*

❊ ❊ ❊

Download Past Papers & Answers at : www.freebooks.lk

Dear students!

We have Past Papers and Answers (Marking Schemes), Model Papers and Note books for English, Tamil and Sinhala Medium).

Please visit :

www.freebooks.lk

or click on this page to vist our site!